# නිව්යෝර්ක් නුවර එකලු කළ බක්මහ උළෙලේ විසිතුරු



නිව්යෝර්ක් ශ්‍රී ලංකා සංගමයේ සභාපතිනී රාජිනී ජාගොඩ මහත්මිය, තානාපති බර්නාඩ් ගුණතිලක මහතා පිළිගත් අවස්ථාව.



ප්‍රින්සි අරිෆ්, දර්ශනී සහදු, කල්‍යාණි රණසිංහ හා අනූෂා ඩයස් රබන් ගසනු අයුරු.



නැටුම් දර්ශන ඉදිරිපත් කළ අයගෙන් මුල්පෙළ නිම්සරයන් රේහානා අරිෆ් සහ සඳිසා තෙල්සන්



ප්‍රින්සි අරිෆ් සහ ආනන්ද සහදු ඉදිරිපත් කළ විකට පවම්නාවේ අවස්ථාවක්

ඇමෙරිකාවේ නිව්යෝර්ක්හි ශ්‍රී ලංකා සංගමය සංවිධානය කළ අවුරුදු උළෙල ඉකුත් ඉරිදා (අප්‍රේල් 22) නිව්යෝර්ක්හි ලගාඩියා ජාත්‍යන්තර ගුවන්තොටුපොළ අසල පිහිටි ෆ්ලෂින්හි (FLUSHING) වර්ල්ඩ් ෆෙයා මැරීනා (WORLD'S FAIR MARINA) ශාලාවේදී, අතිශයින් උත්සවාකාරයෙන් පවත්වන ලදී. ඇමෙරිකාවේ ශ්‍රී ලංකා තානාපති බර්නාඩ් ගුණතිලක, නියෝජ්‍ය තානාපති මහාචාර්ය ආනන්ද පී. ගුරුගේ ප්‍රමුඛ සම්භාවනීය අමුත්තන් රැසක් මෙම අවුරුදු උළෙලට සහභාගී වූහ.

නිව්යෝර්ක්හි වසන ශ්‍රී ලාංකිකයින් මෙහිදී රබන් ගැසීම ඇතුළු විනෝදාංශ රැසක් ඉදිරිපත් කළහ.

නිව්යෝර්ක්හි ශ්‍රී ලංකා සංගමයේ සභාපති රාජිනී ජාගොඩ මහත්මිය ප්‍රමුඛ එම සංවිධානය දේශීය සංස්කෘතික උරුමයන් ලොවට විදහා දැක්වීම සඳහා ලොව අගනුවර වශයෙන් සැලකෙන නිව්යෝර්ක් නගරයෙහි මෙවන් උත්සව සංවිධානය කිරීම අගය කළ යුතු බව මෙහිදී පැවසිය. නිව්යෝර්ක්හි වසන ශ්‍රී ලාංකික සිංහල හා දෙමළ ජනතාව එකමුතුව මෙම උත්සවයට සහභාගී වී සිරි අවුරුදු දක්නා ලදී. මෙහි දැක්වෙනුයේ එම අවුරුදු උළෙලේ අවස්ථා කිපයකි.

**ප්‍රියානා දර්ශනී**
**නිව්යෝර්ක් නුවර,**
**ඇමෙරිකාව.**